# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2458/44 - 2025 ඔක්තෝබර් මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2025.10.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 වූ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය අනුර කරුණාතිලක වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උපලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**අනුර කරුණාතිලක (පා.ම.),**
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 08 වැනි දින,
නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය,
2 වන මහල,
"සෙත්සිරිපාය", අදියර I,
බත්තරමුල්ල.


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I
## බිබිල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1980.04.18 දිනැති සහ අංක 84/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මොනරාගල දිස්ත්‍රික්කයේ බිබිල නාගරික සංවර්ධන බල ප්‍රදේශයට කොටස් වශයෙන් අයත් වන්නා වූ අංක 102D අඹගොල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 102A රදලියද්ද ග්‍රාම නිලධාරි වසමද, අංක 100B රතුපස්කැටිය ග්‍රාම නිලධාරි වසම ද, අංක 101C ලිඳකුඹුර ග්‍රාම නිලධාරි වසම ද, අංක 100 බිබිල ග්‍රාම නිලධාරි වසම ද, අංක 100C අඹේලන්ද ග්‍රාම නිලධාරි වසම ද, අංක 99 දොඩම්ගොල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 99B දෙහිඅත්තාවෙල ග්‍රාම නිලධාරි වසම ද, අංක 99A කණුල්වෙල ග්‍රාම නිලධාරි වසම ද, අංක 100A කුරුවාඹ ග්‍රාම නිලධාරි වසම හා අංක 100E හෙවෙල්වෙල ග්‍රාම නිලධාරි වසම් වලට අමතරව අංක 102D අඹගොල්ල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 102A රදලියද්ද ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 100B රතුපස්කැටිය ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 101C ලිඳකුඹුර ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 100 බිබිල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 100C අඹේලන්ද ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 99 දොඩම්ගොල්ල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 99B දෙහිඅත්තාවෙල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 99A කණුල්වෙල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 100A කුරුවාඹ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 100E හෙවෙල්වෙල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 98A ඊතණවත්ත ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 100D කවුඩැල්ල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, 100F බදුල්ලගම්මන ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටසද, අංක 102 වැගම ග්‍රාම නිලධාරි වසමද, අංක 102C වැගම දකුණ ග්‍රාම නිලධාරි වසමද ඇතුළත් වන්නා වූ මුළු මහත් ප්‍රදේශයම ඇතුළත් වේ.

*II වැනි තීරුව*

*උතුරට :*

අංක 100F බදුල්ලගම්මන ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හා අංක 102C වැගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යයේ (1) සිට අංක 102C වැගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ වයඹ, නිරිත, උතුර හා ඊසාන දිශානුගතව ඇදි රේඛාව අංක 102C වැගම දකුණ ග්‍රාම නිලධාරි වසම හා අංක 102 වැගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය (2) දක්වාද, එතැන් සිට අංක 102 වැගම ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ උතුර හා ඊසාන දිශානුගතව ඇදි රේඛාව අංක 102D අඹගොල්ල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය (3) දක්වාද එතැන් සිට අංක 102D අඹගොල්ල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දිශානුගතව ඇදි රේඛාව අංක 102D අඹගොල්ල ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම අවසන් වන ලක්ෂ්‍යය (4) දක්වාද එතැන් සිට එකී ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොන දිශානුගතව ඇදි රේඛාව 102A රදලියද්ද ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය (5) දක්වා වේ.

*නැගෙනහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 102A රදලියද්ද ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ ඊසාන දිශානුගතව ඇදි රේඛාව අංක 102A රදලියද්ද ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය (6) දක්වාද, එතැන් සිට අංක 102A රදලියද්ද ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු හා ගිණිකොන දිශානුගතව ඇදි රේඛාව අංක 102A රදලියද්ද ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හා අංක 101C ලිඳකුඹුර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය (7) දක්වා ද, එතැන් සිට අංක 101C ලිඳකුඹුර ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ දකුණු හා ගිණිකොණ දිශානුගතව ඇදි රේඛාව අංක 99B දෙහිඅත්තාවෙල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය (8) දක්වා වේ.

*දකුණට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 99B දෙහිඅත්තාවෙල ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණ හා දකුණු දිශානුගතව ඇදි රේඛාව අංක 99A කණුල්වෙල ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය (9) දක්වා ද, එතැන් සිට අංක 99A කණුල්වෙල ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත, වයඹ හා බටහිර දිශානුගතව ඇදි රේඛාව අංක 98A ඊතණවත්ත ග්‍රාම නිලධාරි වසමේ දකුණු

*I වැනි තීරුව*

මායිම හමුවන ලක්ෂ්‍යය (10) දක්වා වේ.

*II වැනි තීරුව*

*බස්නාහිරට :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අංක 98A ඊතණවත්ත ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ නිරිත හා උතුරු දිශානුගතව ඇදි රේඛාව අංක 100E හෙවෙල්වෙල ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය (11) දක්වා ද, එතැන් සිට අංක 100E හෙවෙල්වෙල ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම ඔස්සේ බටහිර, නිරිත හා උතුරු දිශානුගතව ඇදි රේඛාව අංක 100F බදුල්ලගම්මන ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය (12) දක්වා ද, එතැන් සිට අංක 100F බදුල්ලගම්මන ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ වයඹ හා ඊසාන දිශානුගතව ඇදි රේඛාව අංක 102C වැගම දකුණ ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

EOG 10 - 0167

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.